# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල



| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.03.20 පැය 0555 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 472 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. කිඹුලෙකු විසින් දිය නාමින් සිටි දැරියක් ඩැහැගෙන යාමක් - මරදන්කඩවල පොලිස් වසම.**

2026.03.19 වන දින දහවල් මරදන්කඩවල පොලිස් වසමේ හිනුක්කිරියාව වැවේ දියනෑමට ගිය දැරියක් කිඹුලෙකු විසින් ඩැහැගෙන ගොස් ඇති බවට මරදන්කඩවල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 09 ක් වූ ගනේවල්පොල ප්‍රදේශයේ පදිංචි දැරියකි.**

මරණකාරිය තම මිත්තණිය සමග ඉහත වැවේ දියනාමින් සිටියදී මෙම අනතුරට මුහුණ පා ඇති අතර පසුව ගම්වාසීන්, පොලිස් නිලධාරීන් හා වනජීවී නිලධාරීන් විසින් වැවට බැස දැරිය සෙවීමේදී කිඹුලා විසින් ඩැහැගත් දැරිය අතහැර දමා ගොස් ඇති අතර එම දැරිය මරදන්කඩවල රෝහල වෙත ඇතුලත් කිරීමේදී මියගොස් සිට ඇත.

මරදන්කඩවල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද යතුරු පැදි එන්ජින් 16 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නුගේගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2026.03.19 දින සවස වැල්ලම්පිටිය පොලිස් වසමේ බ්‍රැන්ඩියාවත්ත ප්‍රදේශයේදී බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාසයේ නිලධාරින්ට ලද තොරතුරකට අනුව නුගේගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද යතුරු පැදි එන්ජින් 16 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 53 ක් වන බ්‍රැන්ඩියාවත්ත, වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

එකලස් කිරීමේ අරමුණින් මෙම යතුරු පැදි එන්ජින් සැකකරු විසින් සන්තකයේ තබාගෙන සිටි බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. වැල්ලම්පිටිය පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. නීති විරෝධී ලෙස මෙරටට ගෙන්වන ලද බීඩි කොළ තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කල්පිටිය පොලිස් ස්ථානය.**

2026.03.19 වන දින දහවල් කාලයේ රාජ්‍ය බුද්ධි ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කල්පිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කල්පිටිය පොලිස් වසමේ ඒත්තාලය වෙරළ තීරයේදී වැටලීමක් සිදුකර **නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද බීඩි කොළ කිලෝග්‍රෑම් 654 ක් අඩංගු පාර්සල් 20 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන ඒත්තාලය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කල්පිටිය පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. නීත්‍යානුකූල බලපත්‍රයක් නොමැතිව ඩීසල් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - කටුනායක පොලිස් ස්ථානය.**

2026.03.19 දින රාත්‍රී කාලයේ කටුනායක පොලිස් වසමේ හීනටියන ප්‍රදේශයේදී කටුනායක පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරකට අනුව නීත්‍යානුකූල බලපත්‍රයක් නොමැතිව ඩීසල් ලීටර් 410 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 40 ක් වන මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කටුනායක පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. නීත්‍යානුකූල බලපත්‍රයක් නොමැතිව ඩීසල් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - හලාවත පොලිස් ස්ථානය.**

2026.03.19 දින සවස් කාලයේ හලාවත පොලිස් වසමේ මුදලියාවෙල ප්‍රදේශයේදී හලාවත පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරකට අනුව නීත්‍යානුකූල බලපත්‍රයක් නොමැතිව ඩීසල් ලීටර් 55 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 73 ක් වන ඉලප්පදෙනිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හලාවත පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. අධිවේගී පිටත වටරවුම් මාර්ගයේ සිදුවූ අනතුරකින් පුද්ගලයෙකු ජීවිතක්ෂයට - බියගම පොලිස් වසම.**

2026.03.19 දින අළුයම් කාලයේ අධිවේගී මාර්ගයේ කොට්ටාව දෙස සිට කෙලවරපිටිය දෙසට ධාවනය වූ ලොරි රථයක් බියගම පොලිස් වසමේ අධිවේගී මාර්ග පිටත වටරවුම් මාර්ගයේ ආපදාවකට ලක්ව මාර්ගය අයිනේ නවතා තිබූ භාණ්ඩ ප්‍රවාහන ප්‍රයිමූවර් රථයක පසුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ලොරි රථ රියැදුරු රාගම රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු අවුරුදු 29 ක් වූ බණ්ඩාරගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අධිවේගී මාර්ග කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. පදිකයෙකු බස් රථයක ගැටී ජීවිතක්ෂයට - කටුවන පොලිස් වසම.

2026.03.19 දින උදෑසන කාලයේ කටුවන පොලිස් වසමේ වලස්මුල්ල මිද්දෙණිය මාර්ගයේ කටුවන ප්‍රදේශයේදී මිද්දෙණිය දෙසට ධාවනය වූ ලංගම බස් රථයක් මාර්ගයේ වම්පස අයිනේ ගමන් කරමින් සිටි පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා කටුවන රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු අවුරුදු 71 ක් වූ කටුවන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරට සම්බන්ධ බස් රථ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇත. කටුවන පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**